සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

12 S I

## තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 13 - 2019

විභාග අංකය ............................ සාමාන්‍ය පොදු පරීක්ෂණය කාලය පැය දෙකයි මිනි. 30

උපදෙස්

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 සිට 60 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි (x) යොදා දක්වන්න.

01. ශ්‍රී ලංකාවේ වර්තමාන අග විනිසුරුවරයාගේ නම කුමක් ද ?
1. ශාන්ත කෝට්ටේගොඩ 2. ජයන්ත ජයසූරිය 3. සී.ඩී. වික්‍රමරත්න
4. ප්‍රියසාද් ඩෙප් 5. රවීන්ද්‍ර විජේගුණරත්න

02. ශ්‍රී ලංකාවේ දුම්රිය මාර්ග පද්ධතියට එක් වූ නව දුම්රිය මාර්ගය වන්නේ,
1. ගාල්ල - මාතර 2. මාතර - හම්බන්තොට 3. මාතර - කතරගම
4. මාතර - බෙලිඅත්ත 5. ගාල්ල - බෙලිඅත්ත

03. ක්‍රිස්තු වර්ෂ 1400 - 1600 අතර කාලයට අයත් සමූහ මිනීවලක් ශ්‍රී ලංකාවේ එක්තරා ප්‍රදේශයකින් 2018 වසරේදී සොයා ගන්නා ලදි. එම ප්‍රදේශය කුමක් ද ?
1. මන්නාරම 2. යාපනය 3. පුත්තලම 4. ත්‍රිකුණාමලය 5. මුලතිව්

04. ශ්‍රී ලංකාවේ ප්‍රථම කසල රඳවනය ලෙස සැලකෙන අරුවක්කාඩු කසල රඳවනය පිහිටි දිස්ත්‍රික්කය වන්නේ,
1. කුරුණෑගල 2. ගාල්ල 3. කොළඹ 4. පුත්තලම 5. ගම්පහ

05. 2019 ආසියානු සංවර්ධන බැංකු වාර්තාවට අනුව ශ්‍රී ලංකාව ආසියාවේ ඉහළ මන්දපෝෂණයක් සහිත රටවල් අතරට පැමිණ ඇත. එම වාර්තාවට අනුව බංගලා දේශයේ මන්දපෝෂණ අගය 15.2% කි. ඉන්දියාවේ එම අගය 16.4% කි. එම වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ මන්ද පෝෂණ අගය වන්නේ,
1. 20% 2. 22% 3. 24% 4. 25% 5. 26%

06. ශ්‍රී ලංකාවේ භාවිත කරන ගාස්තු රහිත දුරකථන අංකයක් වන 1929 අයත් වන්නේ,
1. ළමා උපකාරක සේවයට 2. ගිලන් රථ සේවයට
3. බෝම්බ නිශ්ක්‍රීය අංශයට 4. මනෝ උපදේශන සේවයට
5. කාන්තා කාර්යාංශයට

07. 2018 වර්ෂයේ ලෝකයේ විශිෂ්ඨතම ක්‍රිකට් විනිසුරුවරයා ලෙස ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලය විසින් නම් කරන ලද ශ්‍රී ලාංකික ක්‍රිකට් විනිසුරුවරයා වන්නේ,
1. සිදත් වෙත්තමුනි 2. ප්‍රේමසර ඇපාසිංහ 3. පාලිත පෙරේරා
4. කුමාර ධර්මසේන 5. රොෂාන් මහානාම

08. ශිෂ්‍යත්වයක් මත ජපානයට ගොස් එහි පර්යේෂණ කටයුතුවල යෙදී සිටින ශ්‍රී ලාංකිකයින් දෙදෙනෙකු විසින් නිර්මාණය කරන ලද චන්ද්‍රිකාවක් මෑතකදී අභ්‍යවකාශගත කරන ලදී. එම චන්ද්‍රිකාව හැඳින්වෙන නම වන්නේ,
1. ශ්‍රී ලංකාවන් 2. සිලෝවන් 3. කලම්බු වන් 4. රාවනා වන් 5. ලක් විජය වන්

09. මාලිබෝන් ක්‍රීඩා සමාජය (MCC) නව සභාපතිවරයා වශයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ කීර්තිමත් නායකයකු ලෙස කටයුතු කළ කුමාර සංගක්කාර තේරී පත්වූ අතර ඔහු එම තනතුරට පත්වූ ප්‍රථම විදේශිකයා ද වේ. එම ක්‍රීඩා සමාජය අයත්වන රට කුමක් ද ?
1. එංගලන්තය 2. ඕස්ට්‍රේලියාව 3. දකුණු අප්‍රිකාව
4. බටහිර ඉන්දීයෙ කොදෙව් 5. අයර්ලන්තය

10. ශ්‍රී ලංකාවේ 71 වන නිදහස් සමරු උළෙල සඳහා ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි වූයේ කවර රටක ජනාධිපතිවරයාද ?
1. පකිස්ථානය 2. ඉන්දියාව 3. ඉන්දුනීසියාව 4. මියන්මාරය 5. මාලදිවයින

11. ආසියානු ශිෂ්ටාචාර පිළිබඳ ප්‍රථම ජාත්‍යන්තර සමුළුව රටවල් 47 ක සහභාගීත්වයෙන් 2019 මැයි මාසයේ දී පැවැත්විණි. එම සමුළුව පවත්වන ලද රට සහ නගරය වන්නේ,
1. ඉන්දියාවේ නවදිල්ලිය 2. පිලිපීනයේ මැනිලා 3. ජපානයේ ටෝකියෝ
4. තායිලන්තයේ බැංකොක් 5. චීනයේ බීජිං

12. 2019 ක්‍රිකට් ලෝක කුසලාන තරඟාවලිය පවත්වන ලද රට වන්නේ,
1. ඕස්ට්‍රේලියාව 2. දකුණු අප්‍රිකාව 3. එංගලන්තය
4. බටහිර ඉන්දීය කොදෙව් 5. පකිස්ථානය

13. මිෂෙල් බැචලෙ, මහ කොමසාරිස්වරිය ලෙස කටයුතු කරන ජාත්‍යන්තර ආයතනය වන්නේ,
1. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ආයතනය 2. පොදු රාජ්‍ය මණ්ඩලය
3. නොබැඳි ජාතීන්ගේ සමුළුව 4. සාර්ක් සංවිධානය
5. ලෝක සෞඛ්‍ය සංවිධානය

14. පැට්‍රීෂියා ස්කොට්ලන්ඩ්, ලේකම්වරිය ලෙස කටයුතු කරන ජාත්‍යන්තර ආයතනය කුමක් ද ?
1. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල 2. පොදු රාජ්‍ය මණ්ඩලය
3. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ආයතනය 4. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
5. සාර්ක් මහලේකම් කාර්යාලය.

15. වඳවීයාමේ තර්ජනයට ලක්ව ඇති වනසතුන් හා පැලැටිවල ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය හැඳින්වෙන කෙටි නාමය වන්නේ,
1. ඒපෙක් සම්මුතිය 2. වියනා සම්මුතිය 3. නේටෝ සම්මුතිය
4. සයිටීස් සම්මුතිය 5. බ්‍රිටෝ සම්මුතිය

16. ක්‍රි.ව. 1867 දී ඩයිනමයිට් නමැති පුපුරණ ද්‍රව්‍ය ලොවට හඳුන්වා දෙන ලද ස්වීඩන් ජාතික රසායන විද්‍යාඥයා වන්නේ,
1. විලියම් හාවි 2. විලියට් ඩෙම්ලර් 3. ඇල්ෆ්‍රඩ් නොබෙල්
4. ඇල්ෆ්‍රඩ් ඇඩ්ලර් 5. බෙනිටෝ මුසොලිනී

17. පකිස්ථානය හා ඉන්දියාව අතර අර්බුද හටගැනීමට හේතුවී ඇති භූමි ප්‍රදේශය කුමක් ද ?
1. උතුරු හිමාලය 2. ටිබෙට් 3. පන්ජාබ් 4. ඩෙකෑන් 5. කාශ්මීරය

18. ඇමරිකා එක්සත් ජනපද සහ උතුරු කොරියානු ජනාධිපතිවරුන් 2018 වසරේදී සාම සාකච්ඡා සඳහා ඉතිහාසය ප්‍රථම වතාවට හමුවූයේ සිංගප්පූරුවේ දී ය. ඔවුන්ගේ දෙවන හමුවීම 2019 පෙබරවාරි මාසයේ දී සිදුවිය. ඒ සඳහා පහසුකම් සපයන ලද රට කුමක් ද ?
1. වියට්නාමය 2. චීනය 3. මැලේසියාව 4. තායිලන්තය 5. තායිවනය

19. 2018 දෙසැම්බර් මාසයේ දී පවත්වන ලද ලෝක කාය වර්ධන තරඟාවලියේදී ශ්‍රී ලාංකික ක්‍රීඩකයකු විසින් රන් පදක්කමක් ජයග්‍රහණය කරන ලදි. ලෝක කායවර්ධන තරඟාවලියකදී ශ්‍රී ලංකාව ලද ප්‍රථම රන් පදක්කම එයයි. එම ක්‍රීඩකයා වන්නේ,
1. නිෂී උග්ගල්ල 2. නලීන් පෙරේරා 3. සුගත් තිලකරත්න
4. ලූෂන් රාජනායගම් 5. අරුණ දර්ශන

20. 2019 අප්‍රේල් හා මැයි මාසවල දී බෙංගාල බොක්කේ හටගත් ප්‍රචණ්ඩ සුළි කුණාටුව හඳුන්වන ලද නම වූයේ,
1. ෆොනී  2. රාවන්  3. ලියෝන්  4. කෙළී  5. ඇලස්

21. අනුයාත පූර්ණ සංඛ්‍යා තුනක එකාය 33ක් වේ. එම සංඛ්‍යා තුනෙහි ගුණිතය වන්නේ,
1. 1290  2. 1300  3. 1310  4. 1320  5. 1330

22. පැත්තක දිග 5cm ක් වන සමචතුරස්‍රාකාර රූපයක් සමාන සමචතුරස්‍ර 25 කට වෙන් කර ඇත. එහි ඇති මුළු සමචතුරස්‍ර ගණන වන්නේ,
1. 50  2. 55  3. 60  4. 65  5. 70

23. සිහින් කම්බියකින් නවා සකස් කළ සැකිල්ලක් පහත රූපයෙන් දැක්වේ. එය සෘජුකෝණික ත්‍රිකෝණයක හැඩයකි. එහි විකර්ණයේ දිග වන්නේ,
1. 18 cm
2. 16 cm
3. 14 cm
4. 10 cm
5. 9 cm




24. P ගේ මව Q ය. P ගේ ස්වාමිපුරුෂයා R ද Q ගේ ස්වාමී පුරුෂයා S ද වේ. ඒ අනුව R සහ S ගේ සම්බන්ධතාවය වන්නේ,
1. S ගේ පියා R ය.  2. S ගේ සහෝදරයා R ය.  3. S ගේ බෑණා R ය.
4. S ගේ මාමා R ය.  5. S ගේ පුතා R ය.

25. 1,3,5,7 ...... සංඛ්‍යා රටාවේ මුල් සංඛ්‍යා 25 හි එකාය වන්නේ,
1. 625  2. 675  3. 700  4. 725  5. 750

26. වාහනයක් යම් දුරක් පළමුවන පැය 2 දී පැයට කිලෝමීටර් 60 ක වේගයෙන් ද ඉතිරි දුර ප්‍රමාණය පැයට කිලෝමීටර් 50 ක වේගයෙන් ද ගමන් කරයි. එම වාහනය ගමන් කළ මුළු දුර 270km ක් නම් ගමනට ගත වූ කාලය එන්නේ,
1. පැය 4  2. පැය 4½  3. පැය 5  4. පැය $5\frac{1}{3}$  5. පැය $5\frac{1}{2}$

27. ස්වයං රැකියාවල නිරත වූ පුද්ගලයින් පිරිසක් පිළිබඳ තොරතුරු වට ප්‍රස්තාරයෙන් දැක්වේ. විසිතුරු මාළු ඇති කරන පුද්ගලයින් ගණන 9 නම් ඕකිඩ් වගා කරන පුද්ගලයින් ගණන වන්නේ,
1. 18  2. 20  3. 21
4. 23  5. 27




❖ **ප්‍රශ්න අංක 28, 29 සහ 30 ප්‍රශ්න පහත විස්තරය මත පදනම් වේ.**

**සුජීවා නදීකාට වඩා වැඩිමල්වන අතර අමාලිට වඩා බාලය. නිලූකා නදීකාට වඩා වැඩිමල්වන අතර සුජීවාට වඩා බාලය. දයානි නදීකාට වඩා බාලය.**

28. වැඩිමල්ම පුද්ගලයා වන්නේ,
1. නිලූකා  2. සුජීවා  3. අමාලි  4. දයානි  5. නදීකා

29. බාලම පුද්ගලයා වන්නේ,
1. නිලූකා  2. සුජීවා  3. අමාලි  4. දයානි  5. නදීකා

30. මධ්‍යස්ථ වයස ඇත්තේ මින් කාට ද ?

1. නිලූකා 2. සුජීවා 3. අමාලි 4. දයානි 5. නදීකා

31. 100 ට අඩු යම් පූර්ණ සංඛ්‍යාවක් 3න් 4න් සහ 5න් බෙදූ විට 1 බැගින් ඉතිරිවේ. එම සංඛ්‍යාව වන්නේ,

1. 91 2. 81 3. 71 4. 61 5. 51

❖ **ප්‍රශ්න අංක 32 - 33 ප්‍රශ්න පහත සංඛ්‍යා පේළි මත පදනම් වේ.**

A - 2, 6, 14, 30, 62 B - 5, 9, 17, 33, 65
C - 3, 8, 13, 18, 23 D - 1, 4, 10, 22, 46
E - 4, 7, 13, 25, 49

32. "සෑම සංඛ්‍යාවකට ම 1ක් එකතුකර 2න් ගුණ කිරීම යන රීතියට අනුව සකස් කළ සංඛ්‍යා පේළි දෙක වන්නේ,

1. A හා B 2. A හා D 3. B හා E 4. D හා E 5. C හා D

33. "සෑම සංඛ්‍යාවක්ම 2 න් ගුණ කර 1ක් අඩු කිරීම යන රීතියට අනුව සංඛ්‍යා පේළි දෙක වන්නේ,

1. A හා B 2. A හා D 3. B හා E 4. D හා E 5. C හා D

34. විෂ්කම්භය 2cm ක් වූ ලෝහ ගෝලයක ස්කන්ධය ග්‍රෑම් 50 කි. විෂ්කම්භය එමෙන් දෙගුණයක් වූ එම ලෝහයෙන්ම සෑදූ ගෝලයක ස්කන්ධය වන්නේ,

1. ග්‍රෑම් 100 2. ග්‍රෑම් 150 3. ග්‍රෑම් 200 4. ග්‍රෑම් 400 5. ග්‍රෑම් 450

35. වෙළෙන්දෙක් දින 5ක දී අඹ ගෙඩි 100ක් විකුණුවේය. පළමු දිනයේ විකුණන ලද ගෙඩි ගණනින් හරි අඩක් දෙවන දිනයේ ද දෙවෙනි දිනයේ විකුණන ලද ගෙඩි ගණනින් හරි අඩක් තුන්වන දිනයේ ද තුන්වන දිනයේ විකුණන ලද ගෙඩි ගණනින් හරි අඩක් හතරවන දිනයේ ද විකුණා ඉතිරි ගෙඩි 40 පස්වන දිනයේ දී විකිණුවේය. ඔහු පළමු දිනයේ විකුණන ලද අඹ ගෙඩි ගණන වන්නේ,

1. 30 2. 32 3. 34 4. 36 5. 38

36. ශත වර්ෂයක් යනු,

1. වසර 10 ක කාලයකි. 2. වසර 100 ක කාලයකි. 3. වසර 10 - 100 අතර කාලයකි.
4. වසර 1000 ක කාලයකි. 5. වසර 100 - 1000 අතර කාලයකි.

❖ **ප්‍රශ්න අංක 37, 38, 39 සහ 40 ප්‍රශ්න පහත රූපය මත පදනම් වේ.**

**ආයතනයක සේවකයින් 7 දෙනෙකුගෙන් ඔවුන්ට කථාකල හැකි භාෂා පිළිබඳ විමසා ලබාගත් තොරතුරු රූපයෙහි දැක්වේ එහි සෘජුකෝණාස්‍රයෙන් සිංහල භාෂාව ද විශාල සෘජුකෝණික ත්‍රිකෝණයෙන් ඉංග්‍රීසි භාෂාවද සමචතුරස්‍රයෙන් දෙමළ භාෂාවද වෘත්තයෙන් ජර්මන් භාෂාව ද නිරූපණය වේ.**




37. සිංහල පමණක් කථා කළ හැකි පුද්ගලයා වන්නේ,

1. A 2. B 3. C
4. D 5. G

38. මෙම භාෂා 4 ම කථා කළ හැකි පුද්ගලයා වන්නේ,

1. A 2. B 3. C 4. D 5. E

39. සිංහල, ඉංග්‍රීසි හා ජර්මන් භාෂා කථා කලහැකි වුවත් දෙමළ කථා කළ නොහැකි පුද්ගලයා වන්නේ,

1. C 2. D 3. E 4. F 5. G

40. භාෂා දෙකක් පමණක් කථා කළ හැකි පුද්ගලයා වන්නේ,

1. A 2. B 3. C 4. D 5. E

❖ **ප්‍රශ්න අංක 41 සිට 44 දක්වා ප්‍රශ්නවල ගැටළුවක් හා ප්‍රකාශ දෙකක් දී ඇත. එම ප්‍රශ්නවලට පිළිතුරුදීමේ දී පහත උපදෙස් අනුගමනය කරන්න.**

- **පිළිතුර සෙවීම සඳහා X ප්‍රකාශය පමණක් ප්‍රමාණවත් නම් A තෝරන්න.**
- **පිළිතුර සෙවීම සඳහා Y ප්‍රකාශය පමණක් ප්‍රමාණවත් නම් B තෝරන්න.**
- **පිළිතුර සෙවීම සඳහා X හා Y ප්‍රකාශ දෙකම අදාළ වේ නම් C තෝරන්න.**
- **පිළිතුර සෙවීම සඳහා X හා Y ප්‍රකාශ දෙකෙන් කුමන හෝ එක් ප්‍රකාශයක් අදාල වේ නම් D තෝරන්න.**
- **පිළිතුර සෙවීම සඳහා X හා Y ප්‍රකාශ දෙකම ප්‍රමාණවත් නොවේනම් E තෝරන්න.**

41. වැඩක් නිම කිරීමට A ට ගතවන දින ගණන කීය ද ?
X : A සහ B යන දෙදෙනාම වැඩෙහි යෙදුනේ නම් දින තුනක් ගතවේ.
Y : B පමණක් වැඩෙහි යෙදුනේ නම් දින හයක් ගතවේ.
1. A 2. B 3. C 4. D 5. E

42. පාසලක ගුරු සංඛ්‍යාව 20 කි. ගුරුවරියන් සංඛ්‍යාව කීය ද ?
X : ගුරු මණ්ඩලයෙන් 25% ක් කුරුණෑගල සිට පැමිණෙති.
Y : ගුරු මණ්ඩලයෙන් 20% ක් ගුරුවරුන්ය.
1. A 2. B 3. C 4. D 5. E

43. A සහ B පාසල් අතර කෙටිම දුර කොපමණ ද ?
X : C පාසල A පාසලට 3km ක් බටහිරින් පිහිටා ඇත.
Y : B පාසල C පාසලට 5km ක් දකුණෙන් පිහිටා ඇත.
1. A 2. B 3. C 4. D 5. E

44. දක්ෂතම ක්‍රීඩිකාව කවුරුන් ද ?
X : අසිතට වඩා රංගිකා දක්ෂය. රංගිකාට වඩා නිමාලි දක්ෂය.
Y : අසිතට වඩා පියුමි දක්ෂය.
1. A 2. B 3. C 4. D 5. E

❖ **පැත්තක දිග 5 cm ක් වූ ලී ඝනකයක පැති 6 ම සුදු වර්ණ ආලේප කර ඉන්පසු එම විශාල ඝනකය පැත්තක දිග 1cm ක් වූ කුඩා ඝනක රාශියකට වෙන් කරන ලද්දේ නම්,**

45. සුදු වර්ණය ආලේප නොවී තිබූ ඝනක සංඛ්‍යාව කොපමණ ද ?
1. 27 2. 3. 4. 5.

46. පැති තුනක පමණක් සුදු වර්ණය ආලේප වී තිබූ ඝනක සංඛ්‍යාව කොපමණ ද ?
1. 2. 8 3. 4. 5.

47. පැති දෙකක පමණක් සුදු වර්ණය ආලේප වී තිබූ ඝනක සංඛ්‍යාව කොපමණ ද ?
1. 27 2. 12 3. 4. 5.

48. සුදු වර්ණය ආලේප වී තිබූ මුළු ඝනක සංඛ්‍යාව කොපමණ ද ?
1. 65 2. 78 3. 84 4. 98 5. 125

49. දිග හරින ලද ඝනකයක රූපයක් පහත දක්වා ඇත. එය ඝනකයක් ලෙස නැවත සකස් කලවිට එහි පිහිටීම නිවැරදිව පෙන්වනු ලබන රූපය කුමක් ද ?



1. 2. 3. 4. 5.

50. පහත දැක්වෙන රූපයේ ඇති ත්‍රිකෝණ සංඛ්‍යාව කීය ද ?



1. 10
2. 12
3. 14
4. 16
5. 20

51. පහත දැක්වෙන රූප 5න් 1ක් අනෙක් රූප හා නොගැළපේ එම රූපය කුමක් ද ?



1. 2. 3. 4. 5.

❖ **ප්‍රශ්න අංක 52 සහ 53 ප්‍රශ්න සඳහා පහත ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.**

අප දැනටමත් දන්නා දෙයක් නැවත අත්දකින විට අප ඒ ගැන දක්වන්නේ අඩු අවධානයකි. අපට තේරුම් ගැනීම අපහසු ඉතා දුෂ්කර දේ කියවන විටත් ඒ පිළිබඳව අපේ අවධානය යොමුවන්නේ අඩු වශයෙනි. අපට දැරිය හැකි යමක් ඇසීමේ දී, කියවීමේ දී හෝ ප්‍රායෝගිකව අත්දැකීමේ දී අපි ඒ වෙත අවධානය යොමු කරමු. ඒ පිළිබඳව දැන ගැනීමේ කුතුහලයක් අප තුළ ගොඩනැගී තිබීම මේ යොමුවීමේ හරය බව අප තේරුම් ගත යුතුය.

52. ඉහත ඡේදයට අනුව සත්‍ය ප්‍රකාශ වන්නේ ,
   1. දන්නා දෙයක් පිළිබඳව වැඩි අවධානයක් යොමු වීම ස්වාභාවික ය.
   2. දුෂ්කර දේ පිළිබඳව අවධානය වැඩිවන විට එය තේරුම් ගැනීම පහසු වේ.
   3. අපට ඇසෙන සියළු දේ කෙරෙහි අපගේ අවධානය යොමු වේ.
   4. ඕනෑම දෙයක් පිළිබඳව කුතුහලය වැඩිවන විට වැඩි අවධානයක් යොමු වේ.
   5. ඕනෑම දෙයක් තේරුම් ගැනීමට අවධානය අත්‍යවශ්‍ය වේ.

53. ඉහත ඡේදයට අනුව අසත්‍ය ප්‍රකාශයක් වන්නේ,
   1. යම් දෙයකට අඩු අවධානයක් යොමුවීමට එක් හේතුවක් වන්නේ, ඒ පිළිබඳ දැනුමක් අප සතු වීමයි.
   2. කියවන දෙයෙහි දුෂ්කරතාවය වැඩිවන විට කියවීමට යෙදෙන අවධානය අඩුවේ.
   3. ඇසීමට හෝ කියවීමට වඩා ප්‍රායෝගික අත්දැකීමට වැඩි අවධානයක් යොමු කෙරේ.
   4. අසන හෝ කියවන දෙස දැරිය හැකි නම් ඊට අපගේ අවධානය යොමුවේ.
   5. යමක් පිළිබඳව අප තුල ඇති කුතුහලය නිසා ඊට අපගේ අවධානය යොමු වේ.

❖ **ප්‍රශ්න අංක 54, 55 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත ඡේදය අදාල කරගන්න.**

ස්වාභාවික විපත් අවම කිරීම උදෙසා ජන මාධ්‍ය වෙතින් සිදුවිය යුතු සේවය ඉමහත්ය. ආපදාවකට පසුව ආපදාවේ විස්තර සඳහා ජන මාධ්‍ය ඉඩකඩ වෙන් කරනවාට වඩා පෙර ආපදා දැනුවත් කිරීම ජනමාධ්‍ය මඟින් සිදුවිය යුතු මහා සේවයක් බව ජනමාධ්‍ය බලධාරීන් අවබෝධ කර ගන්නවා නම් රටක ආපදා කලමනාකරණය ඉතා පහසු කටයුත්තක් වනු නොඅනුමානය.

54. ඉහත ඡේදයට අනුව වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
   1. ජන මාධ්‍ය මඟින් ස්වාභාවික විපත් ඇතිවීම වලක්වා ඇත.
   2. ස්වාභාවික ආපදා වාර්තා කිරීමට ජන මාධ්‍ය වැඩි ඉඩක් ලබාදිය යුතුය.
   3. ස්වාභාවික ආපදාවකට පසු පලවන ජනමාධ්‍ය වාර්තා කියවීමට අප තුල වැඩි කැමැත්තක් ඇත.
   4. ජන මාධ්‍ය බලධාරීහු ආපදා කළමනාකරණය පිළිබඳ මනා අවබෝධයකින් කටයුතු කරති.
   5. ආපදාවක් සිදුවීමට පෙර ඒ පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමට කටයුතු කිරීමට ජනමාධ්‍ය මඟින් සිදුකල යුතු සේවාවකි.

55. ඉහත ඡේදයෙන් ප්‍රධාන වශයෙන්ම කියවෙන්නේ ,
   1. ජනමාධ්‍ය නිසා ස්වාභාවික විපත් අවම වී ඇති බවයි.
   2. පෙර ආපදා වාර්තාකරණය පිළිබඳ ජනමාධ්‍ය බලධාරීන් දැනුවත්ව සිටින බවයි.
   3. ආපදා වාර්තා කිරීමට ජනමාධ්‍යවල ඉඩ කඩ ප්‍රමාණවත් නොවන බවයි.
   4. ආපදා කළමනාකරණය සඳහා ජන මාධ්‍ය බලධාරීන් දැනට වඩා මැදිහත්විය යුතු බවයි.
   5. ජන මාධ්‍ය බලධාරීන්ට රටක ආපදා කළමනාකරණය බාර දිය යුතු බවයි.

56. A සිට J දක්වා දී ඇති සංවාදය නිවැරදි අනුපිලිවෙලට දී නැත. සංවාදයේ නිවැරදි අනුපිළිවෙල දැක්වෙන පිළිතුර තෝරන්න.
   A. මම VIP රක්‍ෂණ සමාගමේ මානව සම්පත් කළමනාකරු බව රසික දසනායක මහත්මයා හඳුනනවා ද ?
   B. මම දන්න තොරතුරු කියන්නම්
   C. හලෝ, සුබ උදෑසනක් ඉන්දික මහත්මයා තමයි කථා කරන්නේ , මොකක් ද අවශ්‍යතාවය ?
   D. ඔව් මම දන්නවා. රසික මහත්මයා අපේ ගමේ කෙනෙක්. එයාට කරදරයක් ද ?
   E. හලෝ සුබ උදෑසනක් ! ඉන්දික මහත්මයාට කථා කරන්න පුළුවන් ද ?
   F. රසික එයාගේ අම්මත් තාත්තත් එක්ක මේ ගමට ආවේ අවුරුදු 15 ට විතර කළින් එදා ඉඳලා මම රසිකව දන්නවා.
   G. නෑ. එහෙම දෙයක් නෙවෙයි. එයා අපේ සමාගමේ රක්ෂාවකට ඉල්ලුම් පත්‍රයක් එවා තිබෙනවා. රසික දසනායක මහත්මයා ගැන ඔබතුමාගෙන් විස්තර ටිකක් දැනගන්න තියෙනවා.
   H. කරුණාකරලා රසික මහත්මයාගේ පවුලේ තොරතුරු කියන්න පුළුවන් ද ?
   I. ඔබ ඔහුව දීර්ඝ කාලයක සිට හඳුනනවා ද ?
   J. රසිකගේ තාත්තා විදුහල්පතිවරයෙක් අම්මා හෙදියක් රසිකගේ අක්කා ගුරුවරියක් රසිකට ඉන්නේ අක්කා කෙනෙක් විතරයි.

   1. EADCGBFHIJ   2. ECADGBIFHJ   3. CEDABGFJIH
   4. ECHJIBDAGF   5. ECADHGJFIB

❖ **ප්‍රශ්න අංක 57 සහ 58 ප්‍රශ්නවල ප්‍රකාශ තුන බැගින් ඇති කුඩා ඡේද පහක් බැගින් දී ඇත. ඉන් එක් ඡේදයක දී ඇති ප්‍රකාශ තුන පමණක් තර්කානුකූල සම්බන්ධතාවක් පෙන්වීම සඳහා නැවත පිළියෙළ කළ හැකිය. එම ප්‍රකාශ තුන අඩංගු ඡේදය තෝරන්න.**

57. 1. නිසල්ගේ ප්‍රියතම විනෝදාංශය චෙස් ක්‍රීඩා කිරීමයි. නිසල්ගේ පියා ඔහුට චෙස් පුවරුවක් රැගෙන දුන්නේය. චෙස් ක්‍රීඩාව බුද්ධි වර්ධනයට උදව් වේ.
   2. රුවිනි පුවත්පත් කියවීමට පුස්තකාලයට ගියාය. පුස්තකාලය පිහිටා ඇත්තේ රුවිනිගේ නිවස අසළය. පුස්තකාලයට අළුතින් සාමාජිකයින් බඳවා ගැනීම සිදු කෙරේ.
   3. රසිකගේ මව ඔහුට වෙසක් කූඩුවක් මිලට ගෙන දුන්නාය. රසික උදෑසන පාසල් යනවිට වෙළඳපලේ ඇති වෙසක් කූඩු දෙස ආසාවෙන් බැලුවේය. රසිකගේ පියා වෙසක් කූඩුව එල්ලීමට රසිකට උදව් කළේය.
   4. අරුණි චිත්‍රපට නැරඹීට ආසා කරයි. අරුණි වෛද්‍යකා නිලියකි. අරුණිගේ පියා චිත්‍රපට නිෂ්පාදකවරයෙකි.
   5. නීතා යාළුවකුගෙන් මල් පැලයක් ඉල්ලා ගත්තේය. නීතාගේ සැමියා ස්වයං රැකියාවක් ලෙස මල් වගා කරයි. නීතා විවේක වේලාවන්හිදී සැමියාට උදව් කරයි.

58. 1. අධික වේගය රථවාහන අනතුරුවලට එක් හේතුවකි. අධිවේගී මාර්ගවල අනෙක් මාර්ගවලට වඩා වේගයෙන් රථවාහන පැදවිය හැකිය. මහා මාර්ගවල වේග සීමා දැක්වෙන පුවරු සවි කර ඇත.
   2. පානීය ජලය අලෙවි කිරීම ස්වයං රැකියාවක් බවට පත්ව ඇත. බැරලෝහ මිශ්‍රිත ජලය පානය කිරීම වකුගඩු රෝගයට එක් හේතුවකි.
   3. පොලිතින් භාවිතය වැඩිවී ඇත. පාරිසරික උෂ්ණත්වය ඉහල ගොස් ඇත. පොලිතීන් පිලිස්සීමෙන් පිළිකා කාරක වායු වායුගෝලයට මිශ්‍ර වේ.
   4. සංචාරක මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ වෙරළ පිළිබඳව කෙටි චිත්‍රපටයක් ලොව පුරා ප්‍රදර්ශනය කරන ලදී. ශ්‍රී ලංකාවේ මුහුදු වෙරළ සංචාරක ආකර්ෂණීය ස්ථානයකි. වෙරළ ආශ්‍රිත සංචාරක හෝටල් විදේශ සංචාරකයින්ගෙන් පිරී පවතී.
   5. දැඩි නියඟය නිසා ජලාශවල ජල මට්ටම අඩු වී ඇත. කෘෂිකර්මාන්තය සඳහා ජලය අත්‍යවශ්‍ය වේ. විදුලි පරිභෝජනය සීමා කරන ලෙස විදුලිබල මණ්ඩලය නිවේදනය කර ඇත.

❖ 1990 සිට 2001 දක්වා කාලය තුල රටවල් පහක් විසින් නිෂ්පාදනය කරන ලද මෝටර් රථ සංඛ්‍යා පහත සටහනෙහි දක්වා ඇත. නිෂ්පාදනය මිලියනවලින් දක්වා ඇත. එම තොරතුරු ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




59. 1997 - 2000 කාල පරිච්ඡේදය තුළ නිෂ්පාදන වේගය වැඩිම රට වූයේ,
    1. ඉන්දියාව 2. ද. කොරියාව 3. ජපානය
    4. එක්සත් ජනපදය 5. මැලේසියාව

60. මෝටර් රථ නිෂ්පාදනය කරනු ලබන මෙම රටවල් 5 විසින් 1998 වසරේ නිපදවන ලද මුළු මෝටර් රථ සංඛ්‍යාව ආසන්න වශයෙන් මිලියන
    1. 100 2. 355 3. 200 4. 260 5. 105

**තෙවන වාර පරීක්ෂණය - மூன்றாந் தவணை பரீட்சை - 2019**

**සාමාන්‍ය පොදු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - පිළිතුරු පත්‍රය**

**பொதுச் சாதாரண பரீட்சை – 2018 தரம் 13 - விடைகள்**

| | | | | | |
|---|---|---|---|---|---|
| 01. 2 | 11. 5 | 21. 4 | 31. 4 | 41. 3 | 51. 4 |
| 02. 4 | 12. 3 | 22. 2 | 32. 2 | 42. 2 | 52. 4 |
| 03. 1 | 13. 1 | 23. 4 | 33. 3 | 43. 3 | 53. 3 |
| 04. 4 | 14. 2 | 24. 3 | 34. 4 | 44. 5 | 54. 5 |
| 05. 2 | 15. 4 | 25. 1 | 35. 2 | 45. 1 | 55. 4 |
| 06. 1 | 16. 3 | 26. 3 | 36. 2 | 46. 2 | 56. 2 |
| 07. 4 | 17. 5 | 27. 3 | 37. 3 | 47. 2 | 57. 3 |
| 08. 4 | 18. 1 | 28. 3 | 38. 5 | 48. 4 | 58. 4 |
| 09. 1 | 19. 4 | 29. 4 | 39. 4 | 49. 5 | 59. 3 |
| 10. 5 | 20. 1 | 30. 1 | 40. 2 | 50. 4 | 60. 2 |